**වසර 200 ක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙන මලෛයගම් (වතුකරයේ) ජනතාවගේ, විශේෂයෙන් බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මලෛයගම් ජනතාවගේ අභිවෘර්ධිය සදහා කළුතර දිස්ත්‍රික්කයේ සිංහල, මුස්ලිම් හා මලෛයගම් ජනතාව නියෝජනය කරමින් රජයට ඉදිරිපත් කරන යෝජනා.**

"වතුකරයේ ජනතා හඬ" සංවිධානය දකුණු පළාතේ මාතර, ගාල්ල, කළුතර, කුරුණෑගල, හා මලෛයගම් ප්‍රදේශ වලින් (වතුකරයේ) සංක්‍රමණයවී මේ වන විට ගම්පහ දිස්ත්‍රික්කයේ විවිධ පීඩාකාරී තත්වයන් තුල ජීවත්වන මලෛයගම් (වතු) ජනතාව සමග ඒකාබද්ධව කටයුතු කරමින් මලෛයගම් ජනතාවගේ අයිතීන් සහ සුභසාධනය උදෙසා ක්‍රියාත්මක වන සිවිල් සංවිධානයක්වේ. විශේෂයෙන් පසුගිය කාලය තුල අප සංවිධානය සිංහල, දෙමල හා මුස්ලිම් හා මලෛයහම් තරුණ තරුණියන් අතර සංහිදියාව වර්ධනය කිරීම සදහා සමාජ ඒකාබද්ධතාවය, සාමය ගොඩනැගීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මකතාවය, ප්‍රජනක සෞඛ්‍ය අයිතීන් පිලිබදව වැඩමුළු හා අත්දැකීම් හුවමාරු වැඩසටහන් පවත්වන ලදී. මෙයට සහභාගිවූ තරුණ තරුණියන් මලෛයගම් ජනතාව මුහුණ දෙන ගැටළු පිලිබදව සාකච්ජා කල අතර ගැඹුරු විග්‍රහයක් කර ගන්නා ලදී. එම ගැටළු විසදීම සදහා කළුතර දිස්ත්‍රික් ලේකම්තුමා, අමාත්‍යතුමන්ලා, පාර්ලිමේන්තු මන්ත්‍රිවරු, රාජ්‍ය නිලධාරින්, ආගමික නායකයින් හා සිවිල් සංවිධාන සමග සාකච්ජා කලයුතු බවට යෝජනාවූ අතර එම ගැටලු විසදාගැනීම සදහා ඉල්ලීම් මාලාවක් ඉදිරිපත් කිරීමටද යෝජනා විය. ඒ අනුව ඉහත සදහන් සාකච්ජාවලට සහභාගිවූ නියෝජිතයින් සාකච්ජා කර, මේ සදහා වන යෝජනාවලිය සකස් කරන ලදී. ඒ අනුව 2025.02.03 වන දින එම ඉල්ලීම් ඔබතුමන්ලා වෙත මෙසේ භාර දීමට කටයුතු කරමු. මේ පිලිබදව ඔබතුමන්ලාගේ අවධාන යොමු කර, කළුතර දිස්ත්‍රික් මලෛයගම් ජනතාවගේ අභිවෘර්ධිය ගොඩනැගීම සදහා කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමු.

**ඉඩමක අයිතිය/ඉඩමේ නීත්‍යානුකූල හිමිකාරිත්වය**

1. 1993 - 2018 වර්ෂය දක්වා විවිධ අවස්ථාවල කළුතර දිස්ත්‍රික් මලෛයහම් ජනතාව සදහා රජය විසින් පර්චස් 7 ක ඉඩම් ලබාදී තිබු නමුත් මෙතෙක් එම ඉඩම් සදහා පිළිගත හැකි නීතිමය ලියවිල්ලක් (ඔප්පු) ලබාදී නොමැත. උදාරණයක් ලෙස අස්කවෙලි වත්ත (පවුල් 28 - 1993 වසර), මුහමදි වත්ත (පවුල් 25 - 2008 වසර), අරපලාකන්ද වත්ත (පවුල් 60 - 2007 වසර), ඩෙල්කිට් වත්ත (පවුල් 32- 1996 වසර) හිල්කුරෆ්ට් (පවුල් - 33- 1996 /1998) ඉදිරිපත් කල හැක. කිසිම නීතිමය ලියවිල්ලක් නොමැති බැවින් තමන්ගේ ඉඩමේ හිමිකාරිත්වය නිදහසේ භුක්තිවිදීමට නොහැකිවී තිබේ. එබැවින් මෙම ජනතාවගේ ඉඩම්වලට ඔප්පු ලබා දී, ඉඩමේ නීත්‍යානුකූල හිමිකාරිත්වය තහවුරු කිරීම සදහා කඩිනමින් පියවර ගැනීමට කටයුතු කිරීම.

   එසේම මෙතෙක් ඉඩම් ලබා ඇති මලෛයහම් ජනතාව පිලිබදව නිච්චිත තොරතුරුවල ගැටළුවක් පවතින බැවින් මේ පිලිබදව සොයා බැලීම සදහා විශේෂ කමිටුවක් පත් කරන ලෙස ඉල්ලා සිටිමු.

2. මෙතෙක් ඉඩම් හෝ නිවාස නොලැබුණු කළුතර දිස්ත්‍රික් මලෛයගම් ජනතාවට ඉඩම් හා නිවාස ලබා දීමට කටයුතු කිරීම සදහා වර්ථමානයේ රජය විසින් මලෛයගම් ජනතාව සදහා දියත් කරන ඉඩම් සහා නිවාස ලබාදීමේ ව්‍යාපෘතියට කළුතර දිස්ත්‍රික්කය ද ප්‍රමුකතා ගත කිරීමට පියවර ගැනීමට කටයුතු කිරීම. එසේම වතුවල ඉඩම් ගැටළු විසදීම සදහා විශේෂ කමිටුවක් පත්කිරීම.

3. ඉඩමක් ලබාගෙන නිවසක් ඉදිකර ගැනීමට නොහැකිව ආර්ථික අපහසුතා හමුවේ ජීවත්වන මලෛයහම් ජනාතාවට නිවසක් ඉදිකර ගැනීම සදහා අවශ්‍ය මූල්‍යමය දායකත්වය ලබාදීම සදහා කටයුතු කිරීම.

**මලෙයගම් ජනතාවගේ මූලික පහසුකම් ගොඩ නැගීම හා රාජ්‍ය සේවාවන්, මලෙයගම් ජනතාවටද නිසි අයුරින් ලබා දීම.**

1. වතු ආශ්‍රිතව මූලික සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය වශයෙන් රෝහල් පහසුකම් ඇති කිරීමට කටයුතු කිරීම සහ දැනට පවතින රෝහල් සහ සායනවලට පැමිණෙන රෝගීන් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීම. (උදා පාලින්දනුවර, බුලත්සිංහල රොහල් වල ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම. එසේම සායනවල ගර්භණී මව්වරුන්ට සහ රෝගීන්ට ලබාදෙන උපදෙස් දමිල භාෂාවෙන් ලබානොදීම නිසා අපහසුතාවයට පත්වීම)

2. පානීය ජලය, වැසිකිලි පහසුකම් හා මේ වන විට ප්‍රාදේශීය සභා හරහා වතු තුල කසල එකතු කිරීමේ ක්‍රියාවලිය නිසි පරිදි සිදුනොවන බැවින්, කසල බැහැර කිරීම සඳහා වන මූලික පහසුකම් නිසිලෙස සංවර්ධනය කිරීමට පියවර ගැනිම.

3. වතුවලට සහ ඉන් පිටතට නිසි ප්‍රවේශයන් සහතික කිරීම සඳහා මාර්ග ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය කිරීම් සහ විධිමත්ව නඩත්තු කිරීමට කටයුතු කිරීම.

4. මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීන්දුවට අනුගතව වතු තුල තැපැල් බෙදා හැරීම විධිමත් කිරීම සඳහා වතුවල ජීවත්වන මලෙයගම් ප්‍රජාවගේ සෑම නිවසකටම වෙනම ලිපිනයන් ලබා දීම සඳහා කඩිනමින් බලධාරින් කටයුතු කිරීම.
5. රජයෙන් ලබා දෙන අස්වැසුම, හා වැඩිහිටි දීමනා නොලැබුනු වතුවල ජීවත්වන මලෙගම් ජනතාවටද එම දීමනා ලබා දීමට කටයුතු කිරීම සහ එහි ඇති අක්‍රමිකතා පිළිබඳව සොයාබැලීමට විනිවිදභාවයෙන් යුක්ත වැඩපිළිවෙලක් සකස් කිරීම .
6. රජයේ ආයතන සඳහා දෙමළ භාෂාවෙන් කටයුතු කල හැකි දමිල රාජ්‍ය නිලධාරින් පත්කිරීම හෝ පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් පියවර ගැනීම .
7. වර්තමාන ආර්ථික අපහසු හමුවේ මලෙයහම් ජනතාව තම දරුවන්ට ආහාර හා අධ්‍යාපනය ලබා දීමේදී දැඩි පීඩාවට පත්ව ජීවත්වේ. මේ වනවිටත් බොහෝ පිරිසකට දිනකට රු 1350 ක් පමණක් ලැබෙන අතර මාසික වැටුප 22,000ට සීමාවේ. මෙම වැටුප වර්තමාන ආර්තික තත්වයට මුහුන දීමට කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ. එබැවින් පසු ගිය රජය විසින් යෝජනා කරන ලද දිනකට රු 1700ක් වැටුප ලබා දීම සඳහා පියවර ගැනීම.

**මලෙයගම් දරුවන්ගේ පාසල් අධ්‍යාපනය හා වෘත්තිය පුහුණු පහසුකම් ගොඩනැගිම.**

1. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මලෙයහම් (වතු) ආශ්‍රිත පාසල් 36 පමණ තිබෙන බවට වාර්තා වුවත් සාමාන්‍ය පෙළ දක්වා පාසල් 12 ක් සහ උසස් පෙළ පාසල් 08 ක් පමණ තිබීම සහ සාමාන්‍ය පෙළ පාසල්වල විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි ඇතුළු තොරතුරු තාක්ෂනය / සංගීතය / නාට්‍ය වැනි විෂයන්වලට ගුරුවරුන් විශාල ප්‍රමාණයක හිගයක් පවතින අතර, උසස් පෙළ හදාරණ ළමුන් සඳහා කළා අංශ සහ වාණිජ අංශ පමණක් මෙම පාසල් වල තිබෙන බැවින් වෙනත් විෂයන් සඳහා එනම් ගණිත අංශය සහ විද්‍යා අංශයට යොමුවීමට නොහැකිවී තිබේ. එසේම සමහර දෙමව්පියන්ගේ මහත් කැපවීම සහ උනන්දු නිසා සුළු පිරිසක් අධ්‍යාපනයෙන් ඉහලට පැමිණියත් ආර්ථික අපහසුතා හා පාසල්වල ගුරුවරු හිගය සහ නිසි පහසුකම් නොමැති බැවින් පාසල් හැරයාමේ තත්වය වර්ධනයවී තිබේ. එබැවින් මේ පිලිබඳව දැඩි අවධානය යොමු කර අදාළ නිලධාරින් සමග සාකච්ජා කර මෙය සඳහා විසඳුම් සෙවීමට කටයුතු කිරීම සහ මෙම පාසල් වලට සාපේක්ෂව ගුරුවරුන් ස්ථාපිත කිරීම සඳහා කඩිනමින් පියවර ගැනීමට කටයුතු කිරීම.

2. පාසල් අධ්‍යාපනය අවසන් කර ඇති මලෙයගම් තරුණ තරුණියන් සඳහා දමිල භාෂාවෙන් ක්‍රියාත්මක වන වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම සහ ඒ ආශ්‍රිත රැකියා අවස්ථා බිහි කිරීමට කටයුතු කිරීම.

3. බස්නාහිර පළාතේ වතු ප්‍රදේශවල ජීවත් වන මලෙයගම් ජනතාවගේ දරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් ගැහැණු දරුවන් පාසල් අධ්‍යාපනය මගදී හැර යයි. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව ගැඹුරු විශ්ලේෂණයක් කර කළුතරදිස්ත්‍රික්කයේ දරුවන්ගේ පාසල් අධ්‍යාපනය ඉහළ නැංවීමට පියවර ගැනීම සඳහා කටයුතු කිරීම.

4. මලෙයගම් දරුවන්ගේ අයිතීන් හා සංස්කෘතික හැකියාවන් වර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හරහා විශේෂ වැඩ පිළිවෙලක් සකස් කිරීම.

**මලෙයගම් කාන්තාවන්ගේ අභිවෘද්ධිය ගොඩ ගැනීම.**

1. මලෙයගම් කාන්තාවන් ද සමාජීය පිළිගැනීමකට ලක්කිරීම සඳහා මලෙයගම් කාන්තාවන්ගේ (වතුවල) අධ්‍යාපනය සහ පෞරුෂ සංවර්ධනය සඳහා ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමින් විශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගැනීම.

2. කාන්තාවන් සඳහා ප්‍රාදේශීය, රාජ්‍යය සහ පළාත්පාලන මට්ටමින් ලබාදෙන සේවාවන් වතුකරයේ කාන්තාවන්ටද ලබා ගැනීමට නිසි ක්‍රමවේදයක් සැකසීම.

3. ග්‍රාමීය කාන්තාවන් විධිමත් බැංකු මඟින් ණය ලබා ගැනීමට යොමු නොවීමට ප්‍රධාන හේතුව වන්නේ විධිමත් බැංකු ණය නිකුත් කිරීමේදී විවිධ ලිපි ලේඛන සම්පූර්ණ කිරීමට හා ඇප කොන්දේසි සපුරාලීම මඟින් කාන්තාවන් අපහසුතාවයට පත් කිරීමයි. ඒ අනුව සරල ක්‍රමවේද තුළින් විධිමත් බැංකු ක්‍රමවේදයක් මඟින් කාන්තාවන්ට සුවිශේෂී වන ණය ලබා ගැනීමට හැකි ක්‍රියාවලියක් හඳුන්වා දීම.

4. තේ වතුවල සහ රබර් වතුවල වැසිකිළි පහසුකම් හා විවේකාගාරයක් නොමැති බැවින් එහි සේවය කරන කාන්තාවන් දැඩි පීඩාවට ලක්වේ. එබැවින් මෙය පිළිබඳව අවධානය යොමු කර අදාළ පහසුකම් ලබා දෙන ලෙස වතු සමාගම්වලට උපදෙස් ලබා දීම සඳහා කටයුතු කිරීම.

5. තම පවුල්වල දරිද්‍රතාවය සහ ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමේ අරමුණින් ගෘහ සේවිකාවන් ලෙස විදේශගතවන මලෙයගම් කාන්තාවන්ගේ පවුල්වල සහ දරුවන්ගේ තත්ත්වය නිරීක්ෂණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගැනීම.

**කළුතර දිස්ත්‍රික්කයේ මලෙයගම් ජනතාව මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා ඉහත සඳහන් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීමට සහකළමණාකරන ක්‍රියාවලියක් ආරම්භ කරන ලෙස ඉල්ලා සිටින අතර ඒ සඳහා වතුකරයේ ජනතා හඬ සංවිධානය ලෙස ඔබතුමන්ලා සමග සහයෝගයෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමු.**